ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව
වෙත යොමු කරන ලද
2023 හා 2024 වර්ෂ සඳහා කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයෙහි
වාර්ෂික කාර්ය සාධන වාර්තා
2021, 2022 හා 2023 වර්ෂ සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තා
2022 හා 2023 වර්ෂ සඳහා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියෙහි වාර්ෂික වාර්තා
2023 වර්ෂය සඳහා  මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ වාර්ෂික වාර්තාව
2021/2022 සහ 2022/2023 වර්ෂ සඳහා  බී සී සී ලංකා ලිමිටඩ් ආයතනයෙහි වාර්ෂික වාර්තා
2021/2022 සහ 2022/2023 වර්ෂ සඳහා  ජාතික ලුණු සමාගමෙහි වාර්ෂික වාර්තා සහ ගිණුම් සම්බන්ධයෙන්
ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ වාර්තාව

පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද්දේ
ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති
ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය, පා.ම. විසිනි
2025 ඔක්තෝබර් මස 07 වැනි අඟහරුවාදා

---------------------------------------------------------------

பொருளாதார அபிவிருத்தி மற்றும் சர்வதேச உறவுகள் பற்றிய துறைசார் மேற்பார்வைக்
குழுவிற்கு  ஆற்றுப்படுத்தப்பட்ட
2023 மற்றும் 2024 ஆம் ஆண்டுகளுக்கான கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை
அபிவிருத்தி அமைச்சின் வருடாந்த செயலாற்றுகை அறிக்கைகள்
2021, 2022 மற்றும் 2023 ஆம் ஆண்டுகளுக்கான இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சபையின்
வருடாந்த அறிக்கைகள்
2022 மற்றும் 2023 ஆம் ஆண்டுகளுக்கான தேசிய இரத்தினக்கல் மற்றும் ஆபரண அதிகார
சபையின் வருடாந்த அறிக்கைகள்
2023 ஆம் ஆண்டுக்கான இரத்தினக்கல், ஆபரண ஆராய்ச்சி மற்றும் பயிற்சி நிறுவனத்தின்
வருடாந்த அறிக்கை
2021/2022 மற்றும் 2022/2023 ஆண்டுகளுக்கான பீ.சீ.சீ. லங்கா லிமிடெட்
நிறுவனத்தின் வருடாந்த அறிக்கைகள்
2021/2022 மற்றும் 2022/2023 ஆண்டுகளுக்கான தேசிய உப்புக் கம்பெனியின் வருடாந்த அறிக்கைகள் மற்றும் கணக்குகள்
பற்றிய பொருளாதார அபிவிருத்தி மற்றும் சர்வதேச உறவுகள்
பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவின் அறிக்கை

பொருளாதார அபிவிருத்தி மற்றும் சர்வதேச உறவுகள் பற்றிய
துறைசார் மேற்பார்வைக் குழுவின் தவிசாளரான
கௌரவ பாராளுமன்ற உறுப்பினர் (சட்டத்தரணி) செல்வி லக்மாலி ஹேமசந்திர
அவர்களால் 2025 ஆம் ஆண்டு ஒக்தோபர் மாதம் 07 ஆம் திகதி வெள்ளிக்கிழமை அன்று
பாராளுமன்றத்திற்குச் சமர்ப்பிக்கப்பட்டது.

---------------------------------------------------------------

Report of the
Sectoral Oversight Committee on Economic Development and International Relations
on
Annual Performance Reports of the Ministry of Industry and Entrepreneurship Development for the Years 2023 and 2024
Annual Reports of the Sri Lanka Export Development Board for the Years 2021, 2022 and 2023
Annual Reports of the National Gem and Jewellery Authority for the Years 2022 and 2023
Annual Report of the Gem and Jewellery Research and Training Institute for 2023
Annual Reports of BCC Lanka Limited for the Years 2021/2022 and 2022/2023
The Annual Reports and Accounts of the National Salt Limited for the Years 2021/2022 and 2022/2023,
referred to
Sectoral Oversight Committee on Economic Development and International Relations

Presented to Parliament by
Hon. Lakmali Hemachandra, Attorney at Law, M.P.,

Chair of the
Sectoral Oversight Committee on on Economic Development and International Relations
on Tuesday 7th October 2025

**<u>කාරක සභාවේ වාර්තාව</u>**

2025 අගෝස්තු මස 20 වන දින පාර්ලිමේන්තුවේදී රැස් වූ ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් පහත සඳහන් කාර්ය සාධන/ වාර්ෂික වාර්තා සලකා බලන ලදී.

- **2024 වර්ෂය සඳහා කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයෙහි වාර්ෂික කාර්ය සාධන වාර්තාව** (2025.07.09 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී)
- **2023 වර්ෂය සඳහා කර්මාන්ත අමාත්‍යාංශයෙහි වාර්ෂික කාර්ය සාධන වාර්තාව** (2024.06.18 දින ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලදුව, 2025.03.15 දින පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී ගනු ලැබූ තීරණය පරිදි දසවැනි පාර්ලිමේන්තුවේ ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලදී)
- **2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව** (2025.05.20 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී)
- **2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව** (2024.08.21 දින ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලදුව, 2025.03.15 දින පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී ගනු ලැබූ තීරණය පරිදි දසවැනි පාර්ලිමේන්තුවේ ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලදී)
- **2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව** (2023.08.09 දින ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලදුව, 2025.03.15 දින පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී ගනු ලැබූ තීරණය පරිදි දසවැනි පාර්ලිමේන්තුවේ ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලදී)
- **2023 වර්ෂය සඳහා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියෙහි වාර්ෂික වාර්තාව** (2025.03.05 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී)
- **2022 වර්ෂය සඳහා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියෙහි වාර්ෂික වාර්තාව** (2024.03.20 දින භාණ්ඩ හා සේවා අපනයනය ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලදුව, 2025.03.15 දින පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී ගනු ලැබූ තීරණය පරිදි දසවැනි පාර්ලිමේන්තුවේ ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලදී)
- **2023 වර්ෂය සඳහා මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ වාර්ෂික වාර්තාව** (2025.03.14 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී)
- **2021/2022 වර්ෂය සඳහා බී සී සී ලංකා ලිමිටඩ් ආයතනයෙහි වාර්ෂික වාර්තාව** (2025.07.24 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී)
- **2022/2023 වර්ෂය සඳහා බී සී සී ලංකා ලිමිටඩ් ආයතනයෙහි වාර්ෂික වාර්තාව** (2025.06.03 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී)
- **2022/2023 වර්ෂය සඳහා ජාතික ලුණු සමාගමෙහි වාර්ෂික වාර්තාව සහ ගිණුම්** (2025.07.24 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී)
- **2021/2022 වර්ෂය සඳහා ජාතික ලුණු සමාගමෙහි වාර්ෂික වාර්තාව සහ ගිණුම්** (2025.07.24 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී)

**<u>සහභාගී වූ කාරක සභික මන්ත්‍රීවරුන්:</u>**

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය, පා.ම., (සභාපති)
ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා, පා.ම.,
ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා, පා.ම.,
ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය, පා.ම.,
ගරු කන්දසාමි ප්‍රභු මහතා, පා.ම.,
ගරු විජේසිරි බස්නායක මහතා, පා.ම.,
ගරු සුරංග රත්නායක මහතා, පා.ම.,
ගරු තිළිණ සමරකෝන් මහතා, පා.ම.

**<u>සහභාගි වූ කාරක සභික නොවන මන්ත්‍රීවරුන්:</u>**

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා, පා.ම., කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍ය
ගරු චතුරංග අබේසිංහ මහතා, පා.ම., කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය

**<u>කාරක සභාවේ ලේකම්</u>**

චූලා හේරත් මහත්මිය, සහකාර අධ්‍යක්ෂ (පරිපාලන)

**සහභාගිවූ නිලධාරීන්**

**කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය**

ජේ. එම්. තිලකා ජයසුන්දර මහත්මිය, ලේකම්
සුභාෂිණී කුලතුංගමුදලි මහත්මිය, අතිරේක ලේකම් (පරිපාලන)
පී. සුසන්ත ජයතිලක මහතා, අතිරේක ලේකම් (පොදු ව්‍යාපාර හා ප්‍රතිව්‍යුහගතකරණ)
එස්. ඩබ්. සී. ජයමිණි මහත්මිය, අතිරේක ලේකම්
ටී.ඩබ්. ගයාන් මහතා, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
කේ. ඒ. බන්දුල කුරුප්පු මහතා, ප්‍රධාන මූල්‍ය නිලධාරි
අයි. එම්. පී. ගුණරත්න මහත්මිය, අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්)
ඩී. පී. එන්. විජේසිරි මහතා, අධ්‍යක්ෂ ජනරාල් (ඉංජිනේරු)
ඩී. ජී. පී. මුනිදාස මහතා, අධ්‍යක්ෂ (සැලසුම්)
එන්. සී. ජයරත්න මහතා, සහකාර අධ්‍යක්ෂ (පොදු ව්‍යාපාර)
දසුන් රාජපක්ෂ මහතා, අධ්‍යක්ෂ (කර්මාන්ත සංවර්ධන)
බී. ඒ. ඩී. එන්. ප්‍රසාදිකා මහත්මිය, අධ්‍යක්ෂ

**සාම්ප්‍රදායික කර්මාන්ත සංවර්ධන අංශය**

එම්. පී. කේ. ජයතුංග මහත්මිය, ප්‍රධාන ගණකාධිකාරි
එච්. වෙලගෙදර මහත්මිය, ප්‍රධාන අභ්‍යන්තර විගණක
පූර්ණිමා එන්. වික්‍රමරත්න මහත්මිය, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
විපුල ජයසේකර මහතා, අධ්‍යක්ෂ (සැලසුම්)

**ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය**

එච්. එන්. කේ. ටී. දුලානි මහත්මිය, අධ්‍යක්ෂ ජනරාල්
ජී. ඩබ්. අමරසිරි මහතා, අධ්‍යක්ෂ (පතල් කැණීම් හා පරිසර)
ටී. එම්. ඒ. පී. කේ. තෙන්නකෝන් මහතා, අධ්‍යක්ෂ (අපනයන සේවා සහ අපනයන අලෙවිකරණ)
ඩබ්. ජී. නුවන් මලින්ද මහතා, අධ්‍යක්ෂ (මුදල්)
බී. කේ. විජේතුංග මහතා, අභ්‍යන්තර විගණක (නියෝජ්‍ය අධ්‍යක්ෂ)
ජී. ඒ. යූ. පී. අබේපාල මෙනෙවිය, නියෝජ්‍ය අධ්‍යක්ෂ (පතල් කැණීම් හා පරිසර)
එම්. එල්. අයි. එම්. ආර්. අරුණ මහතා, සහකාර අධ්‍යක්ෂ (බලාත්මක කිරීම් හා කලාපීය සංවර්ධන)

**මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය**

මහාචාර්ය ජී. ඩබ්. ඒ. රොහාන් ප්‍රනාන්දු මහතා, සභාපති
බී. ජී. ආර්. ඩබ්. ගම්ලත් මහතා, අධ්‍යක්ෂ (පුහුණු හා සංවර්ධන)
ආර්. එම්. එන්. පී. කේ. ජයසිංහ මහතා, වැ.බ. අධ්‍යක්ෂ (පර්යේෂණ)
සජිත් මුහන්දිරම් මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) / වැ.බ. (පරිපාලන හා මානව සම්පත්)

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**

මංගල විජේසිංහ මහතා, සභාපති/ප්‍රධාන විධායක නිලධාරි
ඕ. එම්. සී. කුමුදිනී මුදලිගේ මහත්මිය, අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති හා උපායමාර්ගික සැලසුම්)
කුසල් ඩී. පෙරේරා මහතා, අධ්‍යක්ෂ (මුදල්)
දේවි තක්ෂිලා විජේරත්න මහත්මිය, අධ්‍යක්ෂ (නීති)
රිකා ගෆූර් මහත්මිය, අධ්‍යක්ෂ (මානව සම්පත් කලමනාකරණ)
තක්ෂිල හෙට්ටිආරච්චි මහතා, අභ්‍යන්තර විගණක

**බී. සී. සී. ලංකා ලිමිටඩ්**

පී. අයි. පෙරේරා මහතා, සභාපති
එස්. එම්. සී. ඩබ්. රන්ජන් මහතා, සාමාන්‍යාධිකාරි
ඊ. ඒ. සී. සම්පත් මහතා, සහකාර අභ්‍යන්තර විගණක
ඩී. ඩී. එල්. ඩී. සේනාරත්න මහතා, ගිණුම් සහකාර

**ජාතික ලුණු සමාගම**

ගයාන් වෙල්ලාල මහතා, සභාපති
එම්. ජේ. ටී. මන්සීල් මහතා, සාමාන්‍යාධිකාරි
එම්. අයි. එම්. ඉර්ෂාන් මහතා, කළමණාකරු (පිරිවැය ගිණුම්කරණ)

## 2023 හා 2024 වර්ෂ සඳහා කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයෙහි වාර්ෂික කාර්ය සාධන වාර්තා

### හැඳින්වීම

කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය විසින් 1969 අංක 36 දරන කර්මාන්ත සංවර්ධන පනත, 1990 අංක 46 දරන කර්මාන්ත ප්‍රවර්ධන පනත හා 2006 අංක 17 දරන ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පනත ක්‍රියාත්මක කිරීමේ වගකීම සහ කර්මාන්ත ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීමෙහි වගකීම දරනු ලැබේ. කර්මාන්ත විවිධාංගිකරණයක් හරහා දේශීය, කලාපීය හා ජාත්‍යන්තර සැපයුම් ජාලය හා සම්බන්ධ වෙමින් ගෝලීය තරඟකාරීත්වය තුළ සාපේක්ෂ ලාභයන් වෙත ළඟාවීම සඳහා දේශීය කර්මාන්ත ක්ෂේත්‍රය නවීන ක්‍රමෝපායන් හරහා ශක්තිමත් කිරීම හා ප්‍රවර්ධනය මෙම අමාත්‍යාංශයෙහි විෂය පථය වන අතර විවිධ ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා 34 ක් ද මෙම අමාත්‍යාංශය මඟින් හසුරුවනු ලැබේ.

### කාරක සභා නිරීක්ෂණ

- අන්තර්ජාතික ක්‍රමවේදයට අනුව රටක භාවිතයට ගැනෙන භූමි ප්‍රමාණයෙන් 3% ක ප්‍රමාණයක් කර්මාන්ත සඳහා වෙන්කළ යුතු වුවද, ශ්‍රී ලංකාවේ කර්මාන්ත සඳහා වෙන්කර ඇත්තේ 0.01% ක භූමි ප්‍රමාණයක් පමණක් බැවින් කර්මාන්ත සඳහා ඉඩම් වෙන් කිරීම සඳහා නව ප්‍රතිපත්තියක් සකස්කළ යුතු බව
- කර්මාන්ත සඳහා ඉඩම් බදු දීමේ ක්‍රියාපටිපාටිය තුළ යම් කර්මාන්තයක් පාඩු ලබන තත්වයට පත් වුවද එම කර්මාන්තකරු ඉවත් කිරීමට හැකියාවක් නොමැති බැවින් ඉඩමක් බදු දීමෙන් පසු එම බද්ද ඉවත් කිරීමේ බලතල අමාත්‍යාංශය සතුව තිබිය යුතු බව
- කර්මාන්ත සංවර්ධනයට අවශ්‍ය ආයෝජන පහසුකම් ලබා ගැනීම සඳහා නව ප්‍රතිපත්තියක් සකස් කළ යුතු බව, ඉඩම් භාවිතය පිළිබඳ පනත් සංශෝධනය විය යුතු බව සහ ජාතික භෞතික සැළැස්මට ජාතික ඉඩම් ප්‍රතිපත්තිය ද ඇතුළත් කර එය ශක්තිමත් කළ යුතු බව

සාකච්ඡා කිරීමෙන් අනතුරුව කාරක සභාව 2023 හා 2024 වර්ෂ සඳහා කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයෙහි කාර්ය සාධන වාර්තාවලට එකඟ වූ අතර එම වාර්තා අනුමත කරන ලදී.

## 2021, 2022 හා 2023 වර්ෂ සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තා

### හැඳින්වීම

අපනයන සංවර්ධනය කිරීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ ප්‍රමුඛතම ආයතනය වන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ ස්ථාපනය කර ඇත. ජාතික අපනයන ඉලක්ක සාක්ෂාත් කරගැනීම සඳහා නව ක්‍රමෝපායන් දියත් කිරීමේ දී සිය වගකීම ඉටු කිරීම පිණිස උපදේශක, අධීක්ෂක, ප්‍රවර්ධක, පහසුකම් සැපයුම්කරු සහ දැනුම් සම්පාදක වශයෙන් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය ක්‍රියා කරනු ලබයි.

### කාරක සභා නිරීක්ෂණ

- නව අපනයනකරුවන් හඳුනාගැනීම සඳහා රජයේ සියලුම ආයතනවල දායකත්වය ලබා ගත යුතු බව සහ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අපනයන කටයුතු සඳහා දායක කර ගත යුතු බව
- වැඩි අපනයන විභවයක් සහිත තොරතුරු තාක්ෂණය, ආහාරපාන, කුළුබඩු වැනි ක්ෂේත්‍රවල නව මානයන් හඳුනාගෙන සංවර්ධනය කිරීම, වෙළඳපල විවිධාංගීකරණය කිරීම හා අපනයන පාදක කරගත් ආයෝජන කමිටුවක් නිර්මාණය කර එය බලගැන්වීම සිදුකළ යුතු බව
- සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා නව නීති හා ප්‍රතිපත්ති සකස් කිරීම තුළින් සෑම රාජ්‍ය ආයතනයකටම කාර්යසාධන ඉලක්ක ලබා දීම සහ කාර්යසාධනය නිර්ණය කිරීම සඳහා කළමනාකරණ පද්ධතියක් සකස් කළ යුතු බව
- කර්මාන්ත කලාප සංඛ්‍යාව වැඩි කිරීම, ආනයනය කර නැවත සකස් කරන ලද භාණ්ඩ අපනයනය කිරීමේ ක්‍රියාවලිය දිරිමත් කිරීම සහ කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය කිරීමේ දී බදු සහන ලබා දීම සිදුකළ යුතු බව

සාකච්ඡා කිරීමෙන් අනතුරුව කාරක සභාව 2021, 2022 හා 2023 වර්ෂ සඳහා වූ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාවලට එකඟ වූ අතර එම වාර්තා අනුමත කරන ලදී.

## 2022 හා 2023 වර්ෂ සඳහා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියෙහි වාර්ෂික වාර්තා

### හැඳින්වීම

1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත යටතේ ශ්‍රී ලංකාවේ මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය නියාමනය කිරීමට, සංවර්ධනය කිරීමට හා ප්‍රවර්ධනය කිරීමට බලතල පවතින රාජ්‍ය ආයතනය ලෙස ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පිහිටුවා ඇත. මෙම අධිකාරිය විසින් මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සඳහා අවශ්‍ය වෙළඳපොළ පුළුල් කිරීම, කර්මාන්තයට අදාළ සෑම අංශයකම සේවකයන්ට අවශ්‍ය පුහුණුව ප්‍රවර්ධනය කිරීම, මැණික් හා ස්වර්ණාභරණ අලෙවි කිරීම සඳහා අවශ්‍ය උපදෙස් හා යටිතල පහසුකම් සැපයීම සහ නීති විරෝධී මැණික් ගැරීම වැළැක්වීම වැනි කාර්යයන් රැසක් ඉටු කරනු ලබයි.

**කාරක සභා නිරීක්ෂණ**

- අනවසර මැණික් ගැරීම් හේතුවෙන් රජයට හිමිවිය යුතු ආදායම වෙනත් පුද්ගලයන් අතට පත්වීම මැණික් කර්මාන්තයේ පවතින විශාල ගැටලුවක් බව
- අනවසර මැණික් ගැරීම් නියාමනය කිරීමට නව නීතිරීති සකස් කළ යුතු බව සහ මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත සංශෝධනය කිරීම තුළින් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වෙත අවශ්‍ය බලතල පැවරිය යුතු බව

සාකච්ඡා කිරීමෙන් අනතුරුව කාරක සභාව 2022 සහ 2023 වර්ෂ සඳහා වූ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියෙහි වාර්ෂික වාර්තාවලට එකඟ වූ අතර එම වාර්තා අනුමත කරන ලදී.

**2023 වර්ෂය සඳහා මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ වාර්ෂික වාර්තාව**

**හැඳින්වීම**

1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත යටතේ මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ ප්‍රවර්ධනය හා තිරසාර සංවර්ධනය වෙනුවෙන් පර්යේෂණ සහ පුහුණු සේවාවන් සිදු කිරීම සඳහා මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය පිහිටුවා ඇත. ශ්‍රී ලංකාවේ මැණික් විභව ප්‍රදේශ ගවේෂණය කර තිරසාර ලෙස නෙලා ගැනීම සහ නව ශිල්පීය හා තාක්ෂණික දැනුම සහ කුසලතාවලින් පිරිපුන් ශ්‍රමිකයන් බිහිකිරීම තුළින් ජාතික ආර්ථිකය වර්ධනය කිරීමට දායකවීම මෙම ආයතනයේ අභිමතාර්ථයන් වේ.

**කාරක සභා නිරීක්ෂණ**

- ශ්‍රී ලංකාවේ මැණික් විභවය සිතියම්ගත කිරීම 2010 වර්ෂයේ ආරම්භ කරන ලද අතර මේ වන විට සිතියම් 20 ක් පමණ සකස්කොට අවසන් බව සහ මැණික් විභවය සහිත හඳුනාගත් ඉඩම්වලින් 50% ක් වතු සමාගම්වලට අයත් ඉඩම් බව
- තිරසාර මැණික් කැණීමේ සංකල්පය ප්‍රවර්ධනය කිරීම සඳහා මේ වන විට සැලසුම් සකස් කොට ඇති බව සහ මැණික් ව්‍යාපාරිකයන් විසින් තමා වෙත ලැබෙන වටිනාකමින් වැඩි මැණික් සම්බන්ධයෙන් තොරතුරු හෙළි කිරීමට මැළිකමක් දැක්වීම ඒ සඳහා බාධාවක් බව

සාකච්ඡා කිරීමෙන් අනතුරුව කාරක සභාව 2023 වර්ෂය සඳහා මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ වාර්ෂික වාර්තාවට එකඟ වූ අතර එම වාර්තාව අනුමත කරන ලදී.

**2021/2022 සහ 2022/2023 වර්ෂ සඳහා බී සී සී ලංකා ලිමිටඩ් ආයතනයෙහි වාර්ෂික වාර්තා**

**හැඳින්වීම**

බී සී සී ලංකා ලිමිටඩ් ආයතනය 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත යටතේ 1988.11.04 දින පොදු සමාගමක් ලෙස සංස්ථාගත කර ඇත. ප්‍රධාන වශයෙන් පොල් තෙල් පිරිපහදුවකින් හා සබන් කර්මාන්ත ශාලාවකින් සමන්විත මෙම ආයතනය මගින් පොල් තෙල්, සබන් වර්ග, විශබීජ නාශක සහ පවිත්‍රකාරක නිෂ්පාදනය කරනු ලබයි.

**කාරක සභා නිරීක්ෂණ**

- කිසිඳු රසායනික ද්‍රව්‍යයක් මිශ්‍ර නොකර උසස්ම තත්වයේ පොල් තෙල් නිෂ්පාදනය කරන ආයතනයක් වුවද මෙම ආයතනයේ නිෂ්පාදන සඳහා තත්ත්ව සහතික ලබා ගැනීමට කළමනාකාරිත්වය විසින් ක්‍රියාකර නොමැති බව හා 2025 වර්ෂයේ ඒ සඳහා අයදුම් කර ඇති බව
- 2002 වර්ෂයේ ලාභ නොලබන ආයතනයක් ලෙස වසා දමා තිබූ බී සී සී ලංකා ලිමිටඩ් ආයතනය 2014 වර්ෂයේ සිට නැවත ක්‍රමයෙන් ලාභ ලබන තත්වයට පත්වී ඇති බව සහ මේ වන විට නව කර්මාන්ත ශාලාවක් ආරම්භ කිරීමට සැලසුම් කර ඇති බව

සාකච්ඡා කිරීමෙන් අනතුරුව කාරක සභාව 2021/2022 සහ 2022/2023 වර්ෂ සඳහා බී සී සී ලංකා ලිමිටඩ් ආයතනයෙහි වාර්ෂික වාර්තාවලට එකඟ වූ අතර එම වාර්තා අනුමත කරන ලදී.

**2021/2022 සහ 2022/2023 වර්ෂ සඳහා ජාතික ලුණු සමාගමෙහි වාර්ෂික වාර්තා සහ ගිණුම්**

**හැඳින්වීම**

1938 වර්ෂයේ ලුණු දෙපාර්තමේන්තුව නමින් ආරම්භ කර ඇති ජාතික ලුණු සමාගම 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සීමාසහිත සමාගමක් ලෙස ලියාපදිංචි කර ඇත. මෙම සමාගම විසින් සාමාන්‍ය ලුණු, අයඩීන් මිශ්‍ර ලුණු, තලා දැමූ ලුණු සහ කාර්මික ලුණු නිෂ්පාදනය කරනු ලබයි. ජාතික ලුණු සමාගමෙහි ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශ මන්නාරම සහ අලිමංකඩ පිහිටා ඇති අතර පරිපාලන කාර්යාලය කොළඹ පිහිටා ඇත. ලුණු ලේවායන් මෙහෙයවීම, ලුණු නිෂ්පාදනය, අගය එකතු කිරීම සහ ලුණු හා අතුරු නිෂ්පාදන අලෙවිය ජාතික ලුණු සමාගමෙහි කාර්යයන් වේ.

**<u>කාරක සභා නිරීක්ෂණ</u>**

- රටේ වාර්ෂික ලුණු අවශ්‍යතාවය සැපයීමේ ධාරිතාවය දැනට පවත්වාගෙන යනු ලබන ලුණු ලේවායන් තුළ පවතින බව හා 2021 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වර්ෂාපතන රටාවේ සිදුවූ වෙනස්වීම් මත ලුණු නිෂ්පාදනය පහළ වැටීමෙන් 2024 වර්ෂයේ ලුණු හිඟයකට මුහුණපෑමට සිදුවූ බව
- ලුණු නිෂ්පාදනයේදී ස්වභාවිකව වාෂ්පීකරණ කටයුතු සිදුකිරීමට අමතරව කෘත්‍රිම ක්‍රමවේදයක් භාවිතා කිරීම තුළින් ලුණු නිෂ්පාදනය කිරීම ලුණු ආනයනය කිරීමට වඩා ලාභදායී බව
- මේ වන විට ලුණු නිෂ්පාදනය වැඩි කිරීම සඳහා ජාතික ලුණු සමාගමට අයත් ලේවායන්හි යටිතල පහසුකම් සංවර්ධනය හා නවීකරණය කිරීමේ කටයුතු සිදුකරමින් පවතින බව

සාකච්ඡා කිරීමෙන් අනතුරුව කාරක සභාව 2021/2022 සහ 2022/2023 වර්ෂ සඳහා වූ ජාතික ලුණු සමාගමෙහි වාර්ෂික වාර්තාවලට එකඟ වූ අතර එම වාර්තා අනුමත කරන ලදී.

**<u>කාරක සභාවේ තීරණ</u>**

සලකා බැලීමෙන් අනතුරුව, ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව, පාර්ලිමේන්තුව විසින් කාරක සභාව වෙත යොමු කරන ලද ඉහත සඳහන් කාර්ය සාධන/ වාර්ෂික වාර්තාවන්ට එකඟ වූ අතර ඒ පිළිබඳව සකසන ලද කාරක සභාවේ මෙම වාර්තාව කාරක සභාවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය විසින් 2025 ඔක්තෝබර් මස 07 වැනි අඟහරුවාදා දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි තීරණය කරන ලදී.